මෑතකදී කුරුවිට තරුණියක් ඝාතනයට ලක්වූ පුවතට එවකට විශාල මාධ්‍ය අවධානයක් ලැබී තිබිණි. එහිදී ඇතැම් මාධ්‍ය මගින් ඝාතනයට ලක්වූ එම තරුණියගේ ඡායාරූපය පළ කොට තිබුණු අතර, එසේ ඇගේ ඡායාරූපය පළ කිරීම කෙතරම් යෝග්‍ය වන්නේද යන්න, Ethics Eye අපි මින් පෙර සාකච්ඡාවට ගෙන ඇත්තෙමු.

මේ අතර, එම සිදුවීම සම්බන්ධයෙන් තවදුරටත් ගවේෂණය කෙරෙනා පුවත් වාර්තාවන් කිහිපයක් දිවයින (11/09) සහ මව්බිම (11/09) පුවත්පත් තුළ දක්නට ලැබිණි. එහිදී මව්බිම පුවත් වාර්තාව සමගින් එම තරුණියගේ ඡායාරූපයක් බොඳ කිරීමකින් තොරව පළ කර තිබිණි. දිවයින පුවත් වාර්තාව එම තරුණියගේ ඡායාරූපයක් බොඳ කර දක්වා පළ කර තිබිණි.

2) මෙම සිදුවීමට ලැබුණු පුළුල් අවධානයද සමගින් බැලූ විට, එම ඡායාරූපය පළ කිරීම ඔස්සේ මියගිය අයවලුන්ගේ පවුලේ අයට අනවශ්‍ය සිත්වේදනාවන් ඇති නොවන්නේ ද?

3) මෙම තරුණියගේ ඡායාරූපය පළ කිරීම, එම සිදුවීම භාවාතිෂය ලෙසකින් (Sensationalism) දැක්වීමට තුඩු දෙනු ඇතැයි ඔබ සිතන්නේ ද?

අප මින් පෙර මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පෝස්ටුවට
ප්‍රවේශය: **https://www.facebook.com/ethicseye/posts/1375843832770670**